# ලංකා ඉතිහාසය

## 6.3.1 කෝට්ටේ රාජධානියේ ආරම්භය හා වර්ධනය පැහැදිලි කරයි



Start Your Learning Journey with e-thaksalawa
The National e-learning Portal for The General Education

නිපුණතාව : 6

ශ්‍රී ලාංකේය ශිෂ්ටාචාරයේ ඓතිහාසික විකාශනයහා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි

නිපුණතා මට්ටම : 6.3.1

කෝට්ටේ රාජධානියේ ආරම්භය හා වර්ධනය පැහැදිලි කරයි

## කෝට්ටේ රාජධානියේ ආරම්භය.

කෝට්ටේ රාජධානිය ක්‍රි.ව. 1412 දී ආරම්භ වේ. කෝට්ටේ රාජධානිය පිළිබඳව හැදැරීමට උපයෝගී කර ගත හැකි මූලාශ්‍ර කිහිපයකි.




මූලාශ්‍රයවලට අනුව කෝට්ටේ රාජධානියක් වීමට පළමුව ඉදිවූයේ බලකොටුවක් ලෙස යි. ඒ ගම්පොළ III වන වික්‍රමබාහු රාජ්‍ය කාලයේ ය.

( කෙට්රින්ටන්, ජී. සී. මෙන්ඩිස් මේ මතය පිළිගනී.)

අන්තර්ගතය :- එස්. ඒ. එම්. එස්. නන්දනී සෙනවිරත්න මිය. ලක්දාස ද මැල් විද්‍යාලය, කුරුණෑගල.
සැකසුම :- එච්. එම්. එච් මදුශානි මෙනවිය ජාතික තරුණ සේවා සභාව. ( 2017-2018 )
අන්තර්ගතය පරික්ෂා කිරීම :- ශශිකා හෙට්ටිආරච්චි මෙනවිය , සමුද්‍ර දේවි බාලිකා විද්‍යාලය - නුගේගොඩ
Copyright © www.e-thaksalawa.moe.gov.lk

## කෝට්ටේ රාජ්‍ය බිහිවීමේ පසුබිම.

* කෝට්ටේ මුලින් ම ඉදි කළේ බලකොටුවක් වශයෙනි.

* ඒ ගම්පොළ III වන වික්‍රමබාහු රාජ්‍ය කාලයේ ය.

* කෝට්ටේ බලකොටුව ඉදි කළේ නිශ්ශංක අලකේශ්වර යි.

* කෝට්ටේ බලකොටුව ඉදි කිරීම පිළිබඳ කතා පුවත **චූලවංශය, නිකාය සංග්‍රහය, රාජරත්නාකරය, සද්ධර්මරත්නාකරය, රාජාවලිය** තොරතුරු පෙන්වයි.

කෝට්ටේ
බලකොටුව

කෝට්ටේ
රාජධානියේ
කොඩිය



කෝට්ටේ නගර සැලැස්ම



Copyright www.e-thaksalawa.moe.gov.lk

අන්තර්ගතය :- එස්. ඒ. එම්. එස්. නන්දනී සෙනවිරත්න මිය. ලක්දාස ද මැල් විද්‍යාලය, කුරුණෑගල.
සැකසුම :- එච්. එම්. එච් මදුශානි මෙනවිය ජාතික තරුණ සේවා සභාව. ( 2017-2018 )
අන්තර්ගතය පරික්ෂා කිරීම :- ශශිකා හෙට්ටිආරච්චි මෙනවිය , සමුද්‍ර දේවි බාලිකා විද්‍යාලය - නුගේගොඩ
Copyright © www.e-thaksalawa.moe.gov.lk

ගම්පොළ රාජ්‍ය සමයේ උතුරේ ද්‍රවිඩ බලය පැතිරයාම සිංහල රාජ්‍යයට තර්ජනයක් විය. උතුරේ දෙමළ බලය මැඩීමේ චේතනාවෙන් අලගක්කෝණාර මුලින් ම බලකොටුවක් ඉදි කළ බව චූල වංශයේ සඳහන් වේ.

**චූල වංශය කෝට්ටේ බලකොටුව ඉදි කළ ආකාරය මෙසේ විස්තර කරයි.**

“ වික්‍රමබාහු මහරජු කළ ගිරි වංශානිජාත අලගක්කෝණාර ඇමති කැලණිය නුදුරුව දකුණුපස ජනයා පිරි මාගම සමීපයේ වූ මහ විලෙහි මහ පවුරු වලල්ලක් හා දොරකොටු ආදියෙන් හෙබියා වූ ජයවර්ධන කෝට්ටේ නමින් ප්‍රසිද්ධ වූ නුවර කළේ ය . පින් කැමති වූ, හේ තෙමේ එහි වෙසෙමින් ශාසනාභිවෘධ වූ බොහෝ පිං කළේ ය.”

(චූල වංශය
911 1-8 ගාථා)





Copyright © www.e-thaksalawa.moe.gov.lk

අන්තර්ගතය :- එස්. ඒ. එම්. එස්. නන්දනී සෙනවිරත්න මිය. ලක්දාස ද මැල් විද්‍යාලය, කුරුණෑගල.
සැකසුම :- එච්. එම්. එච් මදුශානි මෙනවිය ජාතික තරුණ සේවා සභාව. ( 2017-2018 )
අන්තර්ගතය පරික්ෂා කිරීම :- ශශිකා හෙට්ටිආරච්චි මෙනවිය , සමුද්‍ර දේවි බාලිකා විද්‍යාලය - නුගේගොඩ
Copyright © www.e-thaksalawa.moe.gov.lk

නිකාය සංග්‍රහය ( 22 පිටුව ) කෝට්ටේ ගොඩනැගීම පිළිබඳ **විස්තර කරයි.**

බලකොටුවක් ලෙස ආරම්භ වුණු කෝට්ටෙ, රාජධානියක් ලෙස වර්ධනය වන්නේ vi වෙනි පරාක්‍රමබාහු රජතුමාගේ පදවි ප්‍රාප්තියත් සමග වේ.

Vi වෙනි පැරකුම්, මාස, හා චන්ද්‍රභානුගේ වංශයට ම අයිති යැයි පරණවිතාන මහතා පවසයි.( C.H.C.P 306 ) වීර අලකේශ්වර අල්ලාගෙන යන විට චෙංහෝ මේ පරාක්‍රමබාහු කුමරුට කෝට්ටේ හා රයිගම පැවරුවා විය හැකි ය. චීන උදව් ඇතිව vi පැරකුම් රජු වූ බව පැහැදිලි යි. බු. ව. 1953 හෙවත් ක්‍රි. ව. 1410/11 ඔහු පළමුව සිහසුනට උරුමකම් කී දිනය යි. බු. ව. 1955(ක්‍රි. ව. 1412)රයිගම රජ වූ දිනය යි.ඔහු මුලින් ම රජ වුයේ රයිගම බව පැරකුම් සිරිත( 28 කව ) හා රාජාවලිය (75 පිට) කියයි.

බු. ව. 1858 (ක්‍රි. ව. 1415) ඔහු කෝට්ටෙ බලයට පත්විය.

Vi පැරකුම්බා රජු 1415 දි කෝට්ටෙ තම රාජධානිය පිහිට වූ බව කුතෝ පවසයි. රාජාවලිය ද, රයිගම රජ වූ රජු පසුව අවුරුදු 3 කින් ජයවර්ධන පුරයට ආ බව කියයි.
(රාජා. 75 සිට)

Vi වෙනි පැරකුම් රජ රයිගම රජ වූ අවුරුදු 3 සිට භික්ෂූන්ට විහාර, රජ මාලිගාව, වීදි ආදිය කරවා සිමා පවුරු බැඳ නගරය සකස් කළ බව රාජාවලිය (76 පිට) කියයි.

රාජධානියකට අවශ්‍ය පරිදි නගරාංග දියුණු කොට ජයවර්ධන පුර නමින් කෝට්ටේ බලකොටුව දියුණු කළේ Vi පැරකුම් රජුයි. Vi පැරකුම් කාලයට අයත් හංස (12-27 කවි) පරෙවි (7-22 කවි) ගිරා (13-30 කවි) සැළලිහිණි (7-14 කවි) හා කෝකිල සංදේශවල (කෝකිල 120-125 කවි) ජයවද්දන පුර උත්කර්ෂයෙන් වර්ණනා වෙයි.

කෝට්ටේ රාජධානිය පිහිටුවා එහි දිගු කලක් රජ කළ ශ්‍රේෂ්ඨතම පාලකයා හයවෙනි පරාක්‍රමබාහු රජතුමා වේ. ඔහු කෝට්ටේ ප්‍රබල රජු පමණක් නොව අවසන් වරට ලංකාව එක්සත් කළ ලංකා ඉතිහාසයේ ශ්‍රේෂ්ඨතම පාලකයෙකි.Vi වෙනි පරාක්‍රමබාහු රජතුමාට පසු කෝට්ටේ රාජධානිය පාලනය කළ රජවරු ගණනාවකි.

අන්තර්ගතය :- එස්. ඒ. එම්. එස්. නන්දනී සෙනවිරත්න මිය. ලක්දාස ද මැල් විදයාලය, කුරුණෑගල.
සැකසුම :- එච්. එම්. එච් මදුශානි මෙනවිය ජාතික තරුණ සේවා සභාව. ( 2017-2018 )
අන්තර්ගතය පරික්ෂා කිරීම :- ශශිකා හෙට්ටිආරච්චි මෙනවිය , සමුද්‍ර දේවි බාලිකා විද්‍යාලය - නුගේගොඩ
Copyright © www.e-thaksalawa.moe.gov.lk

## කෝට්ටේ රාජධානියේ සිටි පාලකයින්

VI වන පරාක්‍රමබාහු

↓

II වන ජයබාහු

↓

VI වන බුවනෙකබාහු

↓

VII පරාක්‍රමබාහු

↓

VIII වන පරාක්‍රමබාහු

↓

IX වන ධර්ම පරාක්‍රමබාහු

↓

VI වන විජයබාහු

↓

VII වන බුවනෙකබාහු

↓

දොන් ජුවන් ධර්මපාල

**ක්‍රි. ව. 1412 - 1565 දක්වා කෝට්ටේ, ලංකාවේ අගනුවර බවට පත්ව තිබුණි**




කෝට්ටේ රාජධානිය බෙදුනු පසු →





Copyright © www.e-thaksalawa.moe.gov.lk
© www.e-thaksalawa.moe.gov.lk